**ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ (අයි-මාර්ග) - 2022**

**-----------------------------------------------------------------**

**ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර අදියර -1 සඳහා 2014 නොවැම්බර් 05 දින එළඹි අංක 3171 එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුම, අදියර -2 සඳහා 2015 මැයි 28 දින එළඹි අංක 3221 එස්ආර්අයි සහ 3222 එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුම්, අදියර -3 සඳහා 2015 දෙසැම්බර් 11 දින එළැඹි අංක 3325 එස්ආර්අයි සහ 3326 එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුම්, අදියර -4 සඳහා 2017 දෙසැම්බර් 15 දින එළඹි අංක 3610 එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුම යන ණය ගිවිසුම්වල IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් සහ වැඩසටහනේ කාලය

වැඩසටහනේ ණය ගිවිසුම්වලට අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ ප්‍රවාහන සහ මහාමාර්ග අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණ වන්නේ, ග්‍රාමීය ප්‍රජාව සහ සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතර මාර්ග ප්‍රවේශතාවය වැඩිදියුණු කිරීමය. මෙහි දිගුකාලීන බලපෑම වන්නේ ජාතික හා පළාත් මාර්ගවල ප්‍රවාහන කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම වේ. ණය ගිවිසුම්වලට අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 117,780 කට සමාන එ.ජ.ඩො. මිලියන 906 ක් වන අතර ඉන් රු. මිලියන 104,000 කට සමාන එ.ජ.ඩො. මිලියන 800 ක් මූල්‍යනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණි. ඉතිරි මුදල වූ රු. මිලියන 13,780 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂිතය. වැඩසටහනේ මූල්‍ය සැලසුම බහු අදියර මූල්‍ය පහසුකම යටතේ අදියර 06 කින් සමන්විත අතර 2022 දෙසැම්බර් 31 දින වන විට එ.ජ.ඩො. මිලියන 557 ක් වූ වෙනම ණය ගිවිසුම් 06 ක් අදියර 04 ක් යටතේ ණය ප්‍රදානකරු සමඟ අත්සන් කර තිබුණි. වැඩසටහන එහි කටයුතු 2014 ජූනි 01 දින ආරම්භ කරන ලද අතර 2024 සැප්තැම්බර් 30 දින වන විට නිමකිරීමට නියමිතය.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට වැඩසටහනේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම ඊට සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කිරීම පිණිස වැඩසටහනේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**2.1** ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු. මිලියන | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **2022** දෙසැම්බර් **31** දිනට නිම කළ මාර්ග පැකේජ **30** ක රු.මිලියන **49,187** ක සිවිල් වැඩ වියදම් පිරිවැය වැඩසටහන විසින් ප්‍රාග්ධනිත කර තිබුණද, එම පැකේජ **30** න් පැකේජ **16** ක් සඳහා රු.මිලියන **743.30** ක වටිනාකමක් ප්‍රාග්ධනිත වටිනාකමට තවදුරටත් ගෙවිය යුතුව තිබුණි. එම නිසා මූල්‍ය ප්‍රකාශනවල නිම කළ | **743.30** | අදාළ ගිණුම්වල සටහන් කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි වටිනාකම් පෙන්විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | මාර්ගවල පිරිවැය එම වටිනාකමින් අඩුවෙන් දක්වා ඇති බව නිරීක්ෂණය විය. | | | |
| (ආ) | **2022** දෙසැම්බර් **31** දිනට නිම කළ කේ් **03** පැකේජය ඇතුළත්ව මාර්ග පැකේජ **30** ක පිරිවැය වැඩසටහන විසින් ප්‍රාග්ධනිත කර තිබුණද, කේ් **03** පැකේජයේ ඇතුළත් මාර්ග **25** කින් **09** ක් සඳහා අත්පත් කර ගැනීමේ සහතික මෙතෙක් නිකුත් කර නොතිබුණි. එම නිසා නිම කළ මාර්ගවල පිරිවැය මූල්‍ය ප්‍රකාශනවල රු.මිලියන **1,667.84** කින් වැඩියෙන් දක්වා තිබුණි. තවද, කේයූ **03**-ආර් පැකේජයේ සියළුම මාර්ගවල අත්පත් කර ගැනීමේ සහතික සමාලෝචිත වර්ෂය අවසානයේ නිකුත් කර තිබුණද මෙම මාර්ගවල සිවිල් වැඩ පිරිවැය වූ රු.මිලියන **2,162.78** ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ නිම කළ මාර්ගවල පිරිවැය යටතේ දක්වා නොතිබුණි. එම නිසා නිම කළ මාර්ගවල පිරිවැය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | **3,830.62** | අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය නිම කළ අතර කේයූ **03**-ආර් කොන්ත්‍රාත් පැකේජය යටතේ නිම කළ මාර්ගවල මාර්ග භාරදීමේ විස්තර **2023** වර්ෂයේදී වාර්තා කර ඇත. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි වටිනාකම් පෙන්විය යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා අයි-මාර්ග සහ අයි-මාර්ග **2** හි ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සම්පූර්ණ ගොඩනැගිලි කුලී වටිනාකම වූ රු.මිලියන **18.32** ක් එක් එක් ඒකකය සඳහා සමානුපාතිකව බෙදාහැරීමකින් තොරව අයි-මාර්ග වැඩසටහන වෙත අය කර තිබුණි. එම නිසා අයි-මාර්ග වැඩසටහනෙහි ව්‍යාපෘති කලමනාකරණ වියදම රු.මිලියන **9.16** කින් වැඩියෙන් දක්වා තිබුණු බව නිරීක්ෂණය විය. | **9.16** | ආ.සං.බැ. ව්‍යාපෘති පරිපාලන අත්පොත (**PAM**) අනුව වෙනත් වැඩසටහන් සඳහා අරමුදල් බෙදාහැරීම සඳහා ප්‍රතිපාදන සලසා නොමැත. | වියදම් වැඩසටහන් අතර සාධාරණව බෙදිහැරිය යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ මිල දී ගත් රු.මිලියන **1.05** ක් වූ කාර්යාල මෘදුකාංග, පරිගනක උපකරණ සහ කාර්යාල උපකරණවල වටිනාකම වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි. එම නිසා මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් අගය එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි. | **1.05** | රු.මිලියන **1.05** කින් වත්කම් මිල දී ගැනීමේ වටිනාකම වූ රු.මිලියන **0.40** ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගත කළ යුතු වේ. ඉතිරි වටිනාකම ව්‍ය.ක.ඒ. වියදම් යටතේ දක්වා ඇත. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි වටිනාකම පෙන්විය යුතුය. |

**2.2** රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත් විශේෂ කොන්දේසි 14.6 උප වගන්තිය | කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ යුතු අතුරු ගෙවීම් සහතිකයේ අවම වටිනාකම එකඟ වූ කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 1.5 කි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළ මා.න.කො. පැකේජ 22 ක නියමිත සීමාවට වඩා අඩු අතුරු ගෙවීම් සහතික 131 ක් සඳහා රු.මිලියන 1,637.27 ක් කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවා තිබුණි. | ගෙවීම් වටිනාකම් නියමිත සීමාවට අඩු වුවද මාසික ගෙවීම් සහතික ඉදිරිපත් කරන ලෙස උපදේශක වෙත (ඉංජිනේරු) උපදෙස් දී තිබුණි. | කොන්ත්‍රාත් කොන්දේසිවල සඳහන් සීමාවන්ට අනුකූල විය යුතුය. |
| (ආ) | කොන්ත්‍රාත් විශේෂ කොන්දේසි 14.7 සහ 14.8 උප වගන්ති | උප වගන්තිය ප්‍රකාරව සේවා යෝජකයා විසින් එක් එක් අතුරු ගෙවීම් සහතිකවල සහතික කළ අගය දින 56 ක් ඇතුළත ගෙවිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ අතුරු ගෙවීම් සහතික 84 ක රු.මිලියන 3,147 ක ගෙවීම් නියමිත කාලය ඉක්මවා දින 01 සිට 793 ක් දක්වා ප්‍රමාදයන් නිරීක්ෂණය විය. ප්‍රමාද වූ කාලය තුළ නොගෙවූ මුදල මත මූල්‍ය ගාස්තු ලබා ගැනීමට කොන්ත්‍රාත්කරුට හිමිකම් ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත්කරුගේ ඉදිරිපත් කිරීම්වල යම් ලේඛන විෂමතා සහ අසම්පූර්ණ භාවයක් තිබිය හැකි අතර සමස්ථ අතුරු ගෙවීම් සහතිකයම ආපසු නොයවා ඉංජිනේරුවරයා විසින් අතපසු වූ ලේඛන ඉල්ලා ඇත. | කොන්ත්‍රාත් කොන්දේසිවලට අනුකූල විය යුතුය. |
| (ඇ) | කොන්ත්‍රාත් පොදු කොන්දේසි 4.2 උප වගන්තිය | කොන්ත්‍රාත්කරු විසින් ලබාගත් පැකේජ 29 ක කාර්යසාධන සුරක්ෂණවල පිරිවැය ප්‍රතිපූරණය සඳහා රු.මිලියන 458.75 ක මුදලක් කොන්ත්‍රාත්කරුවන් වෙත අමතරව ගෙවා තිබුණු අතර කොන්ත්‍රාත්කරුවන්ගෙන් එම වටිනාකම අය කර ගැනීම සඳහා 2022 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ප්‍රමාණ පත්‍රවල ගෙවීම් අයිතමයක් ඇතුළත් කර ඇති බැවින් ඔබගේ වාර්තාවේ සඳහන් පරිදි මෙය අය කර ගත නොහැක. | කොන්ත්‍රාත් කොන්දේසිවලට අනුකූල විය යුතුය. |
| (ඈ) | ප්‍රසම්පාදන අත්පොතෙහි 7.9.2 වගන්තිය | ප්‍රසම්පාදන අත්පොතෙහි 7.9.2 වගන්තිය අනුව සාරානුකූල අවම ලංසුව ඉංජිනේරු ඇස්තමේන්තුව සැළකිය යුතු ආන්තිකයකින් ඉක්මවා යන්නේ | ඉදිරියේදී ඇස්තමේන්තු සකස් කිරීමේදී යථාර්තවාදී මිල ගණන් ඇතුළත් කිරීමට සළකා බලනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | නම්, ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් සතුටුදායක කොන්ත්‍රාත්තුවක් ලබා ගැනීම සඳහා නව ලංසු කැඳවීමක් හෝ ලංසුකරු සමඟ සාකච්ඡා කර එකඟතාවයකට පැමිණිය යුතුය. පැකේජ **03** ක මිල ගණන් ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සැළකියයුතු ලෙස ඉහළ අගයක් වූ අතර එය සියයට **5** සිට සියයට **22** ක පරාසයක විය. | | |
| **(ඉ)** | ලංසු ලේඛණයේ විශේෂ කොන්දේසි **1.6** | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සම්මත ලංසු ලේඛණවලට පටහැනිව කොන්ත්‍රාත්තු එකකට වඩා වැඩි ප්‍රමාණයකට ඉඩ සැලසීමට සාරානුකූල අවම ලංසුකරුට නොහැකිවන පරිදි වැඩසටහන විසින් ලංසු ලේඛණවල **3** වන වගන්තියේ **1.6** යටතේ විශේෂ කොන්දේසියක් ඇතුළත් කර තිබුණි. එම නිසා සාරානුකූල අවම ලංසුකරුට කොන්ත්‍රාත් පැකේජ එකකට වඩා ප්‍රදානය කිරීමට නොහැකි විය. පැකේජ 3 ක මෙවැනි කොන්ත්රාත් ප්‍රදානය කිරීමෙන් වැඩසටහනට එකතු වටිනාකම රු.මිලියන **359.30** ක අතිරේක වැය බරක් දැරීමට සිදුව තිබුණි. | කොන්ත්‍රාත්කරුවෙකු එක් කොන්ත්‍රාත්තුවකට වඩා වැඩි ප්‍රමාණයක් සඳහා සාරානුකූල අවම ලංසුකරු වුවද, එම ලංසුකරුට ප්‍රදානය කළ හැකිවන්නේ එක් කොන්ත්‍රාත්තුවක් පමණක් බව ලංසු ලේඛණයේ ඇගයීම් හා සුදුසුකම් නිර්ණායකවල පැහැදිලිව සඳහන් කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.** භෞතික කාර්යසාධනය

**3.1** ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

**(අ)** ජාතික සහ ග්‍රාමීය මාර්ග

| සංරචකය | ක්‍රියාකාරකම | **2022** දෙසැම්බර් **31** දිනට | | ප්‍රමාදය/ විගණන නිරීක්ෂණය | ප්‍රමාදය සඳහා හේතු |
|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය **(%)** | ලඟාකරගත් කාර්යසාධනය **(%)** | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| ජාතික සහ ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු සම්පූර්ණ කිරීම | ජාතික සහ ග්‍රාමීය මාර්ග | 92.75 | 62.59 | 2022 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 07 ක් ගත වුවද, තෝරාගත් සම්පූර්ණ දිග වූ ජාතික මාර්ග කි.මී. 370 කින් සහ ග්‍රාමීය මාර්ග කි.මී. 2,905 කින් ජාතික මාර්ග 04 ක කි.මී. 27.43 ක් සහ ග්‍රාමීය මාර්ග 566 ක කි.මී. 2,199 ක් පමණක් නිම කර තිබුණි. තවද, 2022 දෙසැම්බර් 31 දිනට සමහර පැකේජ සම්පූර්ණයෙන්ම නිම කර නොතිබීම හේතුවෙන්, මෙම නිම කළ මාර්ගවලින් කි.මී. 72.22 ක දිගින් යුතු ග්‍රාමීය මාර්ග 29 ක් මාර්ග සංවර්ධන අධිකාරියට භාර දී නොතිබුණි. | කොන්ත්‍රාත් මෙහෙයුම්වල අකාර්යක්ෂමතා, ඉන්ධන හා අමුද්‍රව්‍ය හිඟය |

| | |
|---|---|
| කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | ජාතික මාර්ග කි.මී. 371.54 ක් සහ ග්‍රාමීය මාර්ග කි.මී. 3,093.51 ක් ප්‍රදානය කර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දිනට ජාතික මාර්ග (07) කි.මී. 126.27 ක් සහ ග්‍රාමීය මාර්ග (566) කි.මී. 2,791 ක් සම්පූර්ණ කර තිබුණි. |
| විගණකගේ නිර්දේශය | අමතර පිරිවැය වළක්වා ගැනීම සඳහා කාලරාමුව තුළ වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක ලඟා කර ගැනීමට උපරිම උත්සාහයන් ගත යුතුය. |

(ආ) කි.මී. 100,000 ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ පුනරුත්ථාපන කටයුතු

| සංරචක | ක්‍රියාකාරකම | 2022 දෙසැම්බර් 31 දිනට | | ප්‍රමාදය/ විගණන නිරීක්ෂණය | ප්‍රමාදය සඳහා හේතු |
|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය (%) | ලඟාකරගත් කාර්යසාධනය (%) | | |
| නිම කළ ආර්1, ආර්2, කේර් 1 සහ එම්ජ් 1 පැකේජ වල පුනරුත්ථාපන | ග්‍රාමීය මාර්ග | 100 | 29 | අහෝසි කළ ආර්1, ආර්2, කේර් 1 සහ එම්ජ් 1 පැකේජ වල ඉතිරි වැඩ කි.මී. 100,000 ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ | කොන්ත්‍රාත්තු තෝරාගැනීමේ දුර්වලතා. |

| | | |
|---|---|---|
| වැඩ නිම කිරීම | | ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබුණු අතර වැඩසටහන විසින් අහෝසි කළ කොන්ත්‍රාත්කරුවන්ම පුනරුත්ථාපන වැඩ සඳහා නැවත තෝරාගෙන ඇති බව නිරීක්ෂණය විය. තවද, එම කොන්ත්‍රාත්තුවල මූලික වටිනාකම රු.මිලියන **580.14** කින් ඉහළ ගොස් තිබුණු අතර දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘතිය හරහා එම කොන්ත්‍රාත්තුව නැවත ලබා ගැනීමට අවස්ථාව ලබා දීමෙන් අසාර්ථක කොන්ත්‍රාත්කරුවන්ට අනවශ්‍ය ප්‍රතිලාභ ලබා දී ඇති බව නිරීක්ෂණය විය. තවද, නව ගිවිසුම අත්සන් කර මාස **15** ක් ඇතුළත ඉතිරි වැඩ නිම කිරීමට සැලසුම්කර තිබුණද, **2022** දෙසැම්බර් **31** දිනට මාස **29** ක් ඉක්මවා තිබුණද, ප්‍රගතිය සියයට **18** සිට සියයට **50** දක්වා පැවතිණි. |

කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම

ඉතිරි වැඩ කි.මී **100,000** ග්‍රාමීය මාර්ග වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට භාර දෙන ලද්දේ අයි-මාර්ග වැඩසටහන මගින් ගෙවන ලද අත්තිකාරම් අයකර ගැනීමේ කොන්දේසි මතය. අයවියයුතු අත්තිකාරම් මේ දක්වා පියවා නොතිබුණි.

විගණකගේ නිර්දේශය

වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක ලඟා කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

**3.2** කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|

| | | | |
|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත් කොන්දේසි 108.4 උප වගන්තිය අනුව, වැඩසටහන අවසානයේ සියලුම රසායනාගාර ගෘහ භාණ්ඩ සහ මිනින්දෝරු උපකරණ කොන්ත්‍රාත්කරු වෙත ආපසු ලබා දුන්නද, 2022 දෙසැම්බර් 31 දිනට රසායනාගාර ගෘහ භාණ්ඩ සහ මිනින්දෝරු උපකරණ සඳහා රු.මිලියන 397.77 ක් එකවර ගෙවා තිබුණි. මේ අනුව, හිතකර කොන්ත්‍රාත් කොන්දේසි කොන්ත්‍රාත්කරුවන්ට අනවශ්‍ය ප්‍රතිලාභ ලබා දීමට සහ ව්‍යාපෘති පිරිවැය ඉක්මවා යාමට හේතු විය හැකිය. | අනාගත කොන්ත්‍රාත්තුවලදී මෙම ප්‍රතිපත්තිය වෙනස්කිරීමේ හැකියාව සොයා බලනු ලැබේ. | කොන්ත්‍රාත් කොන්දේසි අනුගමනය කිරීමට උපදෙස් ලබා දිය යුතුය. |
| (ආ) | කොන්ත්‍රාත් පොදු කොන්දේසිවල 8.4 වගන්තියේ දක්වා ඇති පරිදි පිළිගත් හේතූන් මත කොන්ත්‍රාත්කරුට වැඩ නිම කිරීම සඳහා කාලය දීර්ඝ කිරීම් සඳහා හිමිකම් ඇති අතර, කොන්ත්‍රාත්කරුගේ අකාර්යක්ෂමතාව, අයහපත් දේශගුණය, අමුද්‍රව්‍ය හිඟය, කොවිඩ් වසංගතය යනාදිය මත කාල දීර්ඝ කිරීම් ලබා දී ඇති බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) | 2022 වර්ෂය තුළ වයඹ පළාතේ පැකේජ 8 ක කොන්ත්‍රාත් කාලය කිහිපවරක් දීර්ඝ කර තිබුණි. කෙසේවුවද, කාල දීර්ඝ කිරීම් සඳහා වූ සාධාරණීකරනය කිරීම් විගණනයට පිළිගත නොහැකි විය. | කො.පො.කො. 8.4 උප වගන්තියේ විධිවිධානවලට බාහිරව කිසිඳු කාල දීර්ඝ කිරීමක් ලබා දී නොතිබුණි. | කොන්ත්‍රාත්කරුගේ වැඩ සමීපව නිරීක්ෂණය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | වයඹ පළාතේ කාල දීර්ඝ කිරීම් දින 55 සිට 432 දක්වා පරාසයක වූ අතර එය මූලික කොන්ත්‍රාත් කාලයෙන් (දින 730) සියයට 7 සිට සියයට 59 ක් නියෝජනය විය. | අයහපත් දේශගුණය, කොවිඩ් වසංගතය අමුද්‍රව්‍ය හිඟය සහ ආර්ථික අර්බුදය මත අනුමත කළ සම්පූර්ණ කාල දීර්ඝ කිරීමේ දින ගණන වෙනස් විය හැක. | කොන්ත්‍රාත්කරුගේ වැඩ සමීපව නිරීක්ෂණය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (iii) | කලින් ඉදිරිපත් කළ කාල දීර්ඝ කිරීම් සඳහා අනුමැතිය ලබාගැනීමකින් තොරව වැඩසටහන නැවත නැවතත් කාල දීර්ඝ කිරීම් ලබා දී තිබුණි. | ඉංජිනේරුවරයා විසින් එය විශ්ලේෂණය කර කොන්ත්‍රාත්කරුට හිමි කාල දීර්ඝ කිරීම් දින ගණන නිර්දේශ කරනු ලැබේ. | කොන්ත්‍රාත්කරුගේ වැඩ සමීපව නිරීක්ෂණය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (iv) | කොන්ත්‍රාත් පැකේජවල කාල දීර්ඝකිරීමේ දිනය සැළකියයුතු කාලසීමාවකින් ඉක්මගොස් තිබුණද, කොන්ත්‍රාත් පොදු කොන්දේසි 8.7 ප්‍රකාරව තවදුරටත් කාල දීර්ඝකිරීම් ලබාදීමට හෝ ප්‍රමාද ගෙවීම් අය කිරීමට වැඩසටහන විසින් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | කාල දීර්ඝ කිරීම් ඉදිරිපත් කර නොමැති කොන්ත්‍රාත් සඳහා කො.පො.කො. 8.7 උප වගන්තිය යටතේ ප්‍රමාද ගෙවීම් පනවා ඇත. | කොන්ත්‍රාත් කොන්දේසිවලට අනුගත විය යුතුය. |
| (ඇ) | මාර්ග සංවර්ධන අධිකාරිය සහ කි.මී. 100,000 ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහනට පැවරූ කොන්ත්‍රාත් පැකේජවලට අදාළ කොන්ත්‍රාත්කරු අතර එළඹී ගිවිසුම | කොන්ත්‍රාත්කරුවන් සියළුම පැකේජවල වැඩ ආරම්භ කළද, වසංගත තත්ත්වය | හිඟ ශේෂ අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අනුව, සහතික කළ අතුරු බිල්පත් ගෙවීම් ප්‍රමාණයෙන් අයකරනොගත් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් පියවීමට දෙපාර්ශවයම එකඟ වී තිබුණි. කෙසේවුවද, 2022 දෙසැම්බර් 31 දිනට පැකේජ 4 ට අදාළ අයකරනොගත් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් රු.මිලියන 963.26 ක් බව නිරීක්ෂණය විය. | හේතුවෙන් අපේක්ෂිත ප්‍රගතිය ලබා කර ගැනීමට නොහැකි විය. | |
| (ඇ) | කොන්ත්‍රාත් පැකේජ 12 කට අදාළ රු.මිලියන 2,793.41 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වටිනාකම කොන්ත්‍රාත් අහෝසිකළ විගස අයකරගැනීමට වැඩසටහන විසින් කඩිනම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර එම අත්තිකාරම් වසර 03 ක සිට අය නොවී පැවතුණි. | ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය විසින් මෙම මුදල් අයකර ගැනීමට සෑම පියවරක්ම ගනු ලැබුවද, එය වැළැක්වීමට කොන්ත්‍රාත්කරුවන් විසින් අධිකරණ නියෝග ලබාගෙන තිබුණි. අධිකරණ කටයුතු අවසන් වූ පසු අත්තිකාරම් ආපසු අයකර ගනු ලැබේ. | හිඟ ශේෂ අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | කොන්ත්‍රාත් අහෝසි කර වසර 03 කට වැඩි කාලයක් ගත වුවද, අහෝසි කරන ලද ජී 01 සහ කේඑල් 02 කොන්ත්‍රාත් 02 හි ඉතිරි වැඩ නිම කිරීමට වැඩසටහන විසින් කිසිදු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ජී1 පැකේජය යටතේ වන මාර්ග අයි-මාර්ග වැඩසටහනෙන් ඉවත්කර ඇත. අධිකරණ වාරණ නියෝග හේතුවෙන් කේඑල් 02 කොන්ත්‍රාත්තුවේ ඉතිරි වැඩ නිම කිරීම අත්හිටුවා ඇත. | වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක ලබා කර ගැනීමට උපරිම උත්සාහයන් ගත යුතුය. |
| (ඊ) | අහෝසි කළ පැකේජ 12 ක වටිනාකම රු.මිලියන 2,618.51 ක් වූ කාර්යසාධන බැඳුම්කර කල් ඉකුත් වී තිබුණි. කෙසේවුවද, එම වටිනාකම අය කර ගැනීමට වැඩසටහන විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | කාර්යසාධන ඇපකර මුදල් කර ගැනීමට අප විසින් ක්‍රියාමාර්ග ගෙන තිබුණද, අධිකරණ ක්‍රියාදාමයන් අවසන් වන තෙක් මෙය අය කර ගත නොහැක. | ඇපකර වහාම මුදල් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (උ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.9.3 වගන්තිය අනුව, කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 500 ට වැඩි වන විට කොන්ත්‍රාත් ගිවිසුම් රේඛීය අමාත්‍යාංශ ලේකම් විසින් අත්සන් කළ යුතුය. කෙසේවුවද, එම සීමාව ඉක්ම වූ වැඩසටහනේ සිවිල් වැඩ කොන්ත්‍රාත් 75 ක් සහ උපදේශන කොන්ත්‍රාත් 4 ක් මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා විසින් අත්සන් කර තිබුණි. | 1981 අංක 73 දරණ මාර්ග සංවර්ධන අධිකාරී පනත අනුව, මා.සං.අ. ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවල සේවායෝජක මා.සං.අ. බැවින් මා.සං.අ. සමඟ එළඹී සියළු කොන්ත්‍රාත් අත්සන් කිරීමට මා.සං.අ. සභාපතිවරයාට අධිකාරීත්වය හිමිව ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුගත විය යුතුය. |

(ඌ) කේවල උපදේශනය

(1) ප්‍රසම්පාදන විශේෂඥ

2015 අගෝස්තු 20 දිනෙන් අවසන් වන දින 132 ක

| | | | |
|---|---|---|---|
| | කාල සීමාව සඳහා රු.මිලියන 2.84 කට 2015 ජනවාරි 15 දින වැඩසටහන විසින් ප්‍රසම්පාදන විශේෂඥයෙකු බඳවාගෙන තිබුණි. කොන්ත්‍රාත්තුව 11 වරක් දීර්ඝ කර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ ගෙවීම රු.මිලියන 56.91 ක් විය. පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| (i) | 2022 දෙසැම්බර් 31 දිනට ගිවිසුම් වටිනාකමට අමතරව රු.මිලියන 6.33 ක ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි. | තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ මත ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා දී තිබුණි. | ගිවිසුම් කොන්දේසිවලට අනුකූල විය යුතුය. |
| (ii) | එකම ප්‍රසම්පාදන විශේෂඥවරයා විසින් අයි-මාර්ග හා අයි-මාර්ග 2 යන වැඩසටහන්වල ප්‍රසම්පාදන කටයුතු සිදු කර තිබුණි. කෙසේවුවද, වැඩසටහන් දෙක අතර වියදම සමානුපාතිකව බෙදාහැරීමකින් තොරව මුළු වියදම වූ රු.මිලියන 56.91ක් අයි-මාර්ග වැඩසටයනෙහි වියදම ලෙස ගිණුම්ගත කර තිබුණි. | අයි-මාර්ග වැඩසටහන සඳහා උපදේශක බඳවාගෙන ඇත. අයි-මාර්ග මඟින් බඳවාගන්නා ලද සියළු නිලධාරීන් අයි-මාර්ග II හි සේවය කරයි. | වැඩසටහන් අතර වියදම් සාධාරණව බෙදාහැරිය යුතුය. |
| (2) | ලේඛන විශේඥ<br>මාස 12 ක කාල සීමාවක් සඳහා දිනකට රු.13,500 ක රේටයකට වැඩසටහන විසින් 2018 අප්‍රේල් 02 දින ලේඛන විශේඥයකු බඳවාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා වැඩසටහන විසින් රු.මිලියන 20.03 ක් වෙන්කර තිබුණි. පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) | මෙම පත්කිරීම සඳහා වූ ආ.සං.බැ. එකඟතාවය විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර මෙම තනතුර වැඩසටහනේ පහසුකම් පරිපාලන අත්පොතෙහි සඳහන් කර නොතිබුණි. | ලේඛන විශේඥ තනතුර වැඩසටහනේ පහසුකම් කළමනාකරණ අත්පොතෙහි ඇතුළත් කර නොමැති අතර එම නිසා ආ.සං.බැ. හි එකඟතාවය අවශ්‍ය නොවේ. | ගිවිසුම් කොන්දේසි අනුගමනය කළ යුතුය. |
| (ii) | එකම ලේඛන විශේඥවරයා විසින් අයි-මාර්ග හා අයි-මාර්ග 2 යන වැඩසටහන්වල ලේඛන කටයුතු සිදු කර තිබුණි. කෙසේවුවද, වැඩසටහන් දෙක අතර වියදම සමානුපාතිකව බෙදාහැරීමකින් තොරව මුළු ප්‍රතිපාදනය වූ රු.මිලියන 20.03 ක් අයි-මාර්ග වැඩසටයනෙහි වියදම ලෙස ගිණුම්ගත කර තිබුණි. | අයි-මාර්ග වැඩසටහනෙහි කිසිඳු නිශ්චිත අදියරක් සඳහා තනතුර විශේෂිත නොවන අතර ව්‍යාපෘති සම්බන්ධීකරණ කාර්යාලයේදී උපදේශකගේ සහාය භාවිතා කර ඇත. | වැඩසටහන් අතර වියදම් සාධාරණව බෙදාහැරිය යුතුය. |

3.3 උපයෝජනය නොකළ සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් රු.මිලියන 15,358 ක් වෙන් කර තිබුණද, සත්‍ය වියදම රු.මිලියන 14,501.12 ක් විය. එම නිසා, 2022 දෙසැම්බර් 31 දිනට ඉතිරිය රු.මිලියන 856.88 ක් විය. කෙසේවුවද, එදිනට කොන්ත්‍රාත් සඳහා ගෙවිය යුතු ශේෂය රු.මිලියන 3,582.24 ක් විය. | සටහන් කර ඇත. | කාල සීමාව තුළ වැඩසටහනේ අරමුදල් කාර්යක්ෂමව භාවිතා කළ යුතුය. |

### 3.4 පරිබාහිර ගෙවීම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට උපයෝජනය නොකළ ණය මුදල් වෙනුවෙන් එ.ජ.ඩො. මිලියන 1.13 කට සමාන රු.මිලියන 183.52 ක වටිනාකමක් වූ සමුච්චිත බැඳීම් ගාස්තු වැඩසටහන විසින් ණයදෙන නියෝජිතායතනයට අනාර්ථිකව ගෙවා තිබුණි. | ණය අදියර වශයෙන් ලැබෙන අතර සැලසුම් කළ කාල සීමාව තුළ ණය භාවිතා කිරීමෙන් බැඳීම් ගාස්තු අවම කර ගත හැකි වේ. | වැඩසටහනේ අරමුදල් කාර්යක්ෂමව භාවිතා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.5 ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයට අදාළ ගැටළු

| ප්‍රධාන තනතුර | ව්‍යා.මෙ.ඒ. සේවා කාලය | වෙනත් ආයතනයක සේවය කර තිබේද | සේවා පදනම කොන්ත්‍රාත් පදනම/ වැඩ බැලීමේ පදනම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘති අධ්‍යක්ෂ | මාස 26 | ඔව් (මාර්ග සංවර්ධන අධිකාරිය) | වැඩ බැලීමේ පදනම | පූර්ණ කාලීන ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු පත් කිරීම සඳහා සලකා බලනු ලැබේ. | චක්‍රලේඛ උපදෙස් අනුව ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා සෑම විටම පූර්ණ කාලීන පදනමින් බඳවා ගත යුතුය. |

### 3.6 පද්ධති හා පාලන

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැඩසටහනේ පහසුකම් පරිපාලන අත්පොත සහ 2019 මාර්තු 05 දිනැති අංක. 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9 වගන්තිය අනුව, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය හා සම්බන්ධීකරණය කිරීම සඳහා අවම වශයෙන් කාර්තුවකට වරක්වත් ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවක් පැවැත්විය යුතුය. කෙසේවුවද, 2022 වර්ෂයේ පළමු සහ | එකඟ වේ. | සියළුම මෙහෙයුම් කමිටු නියමිත පරිදි ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තෙවන කාර්තුවල රැස්වීම් පවත්වා නොතිබුණු බව නිරීක්ෂණය විය. | | |
| (ආ) | සේවයෝජකයාගේ හා උපදෙශකගේ කාර්ය මණ්ඩලයට පහසුකම් සැපයීම සඳහා රු.මිලියන 1,778.73 ක පිරිවැයට වැඩසටහන විසින් මිලදී ගත් වාහන 166 ක් සහ යතුරුපැදි 164 ක් 2020 වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරියට භාර දී තිබුණි. කෙසේවුවද, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් යාවත්කාලීන ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා නොතිබුණ අතර මෙම වත්කම් සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදු කිරීමට ද අපොහොසත් වී තිබුණි. එමනිසා, මෙම වත්කම්වල පැවැත්ම තහවුරු කර ගැනීමට විගණනයේදී නොහැකි විය. | මෙම වත්කම් මා.සං.අ. යාන්ත්‍රික අංශයට හෝ එහි නියෝජිතායතනයකට හෝ භාර දී ඇති අතර පවරා ගැනීමේ ලිපි අප සතුව ඇත. | ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |